

# සුව දිවියයි - දිරි සවියයි

## SL GAP සහතිකකරණය යටතේ බෝග නිෂ්පාදනය



බීජ සහතික කිරීමේ සේවය

කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, කෘෂිකර්ම අමාත්‍යාංශය

# සුව දිවියයි - දිරි සවියයි

## SL GAP සහතිකකරණය යටතේ බෝග නිෂ්පාදනය

කෘෂිකර්ම දෙපාර්තමේන්තුව - 2019



## හැඳින්වීම

වර්තමානයේ ශ්‍රී ලංකාවේ කෘෂි නිෂ්පාදනය සැලකීමේ දී ඉහළ යන ජනගහන වර්ධන සීඝ්‍රතාවයට සාපේක්ෂව ආහාර සුරක්ෂිතතාවය පවත්වා ගැනීමත්, ආර්ථික චිරස්ථායි ලෙස ප්‍රමාණාත්මක කෘෂි නිෂ්පාදන වෙළඳපොලක් පවත්වා ගැනීමත් හා සෞඛ්‍යාරක්ෂිත බව තහවුරු වන ගුණාත්මක නිෂ්පාදනයක් සිදු කිරීම යන සියළු කරුණු කළමනාකරණය කිරීම බොහෝසේ අපහසු කාර්යයකි. මන්ද යත් වෙළඳපොළ ලාභය, කෘමි පළිබෝධ නිසාවෙන් අස්වනු අධිකව හානිවීම හා කෘමි හානි වලින් තොර සුපිරිසිදු ආකර්ෂණීය එළවළු, පලතුරු බෝග සඳහා වන පාරිභෝගික අපේක්ෂාව ආදී කරුණු නිසාවෙන් බොහෝ නිෂ්පාදකයින් එම ඉලක්ක සපුරා ගැනීම අරමුණු කොට අවිධිමත් ලෙස අධික කෘෂි රසායන ප්‍රමාණයක් තම බෝග නිෂ්පාදනයන්හි දී භාවිතයට පෙළඹී වී ඇත.

මෙහිදී නිර්දේශයන්ට පටහැනිව කෘෂි රසායන යෙදීම හා නිසි පරිදි පෙර අස්වනු කාල කළමනාකරණය නොකිරීම මෙන්ම අවිධිමත් පසු අස්වනු සැකසීමේ කටයුතු හේතුවෙන් හානිකර ක්ෂුද්‍ර ජීවී ක්‍රියාකාරකම් වැනි රසායනික නොවන අස්වනු දූෂණයවීම් හේතුවෙන් අප පරිභෝජනයට ගන්නා බොහොමයක් එළවළු, පලතුරු භාවිතයට නුසුදුසු තත්ත්වයේ ඒවා විය හැක.







අද අප සමාජය වෙලා පවතින පිළිකා රෝග, හෘද රෝග හා හඳුනා නොගත් වකුගඩු රෝගය (CKDU) ආදී බොහොමයක් බෝ නොවන රෝග සඳහා සෘජු හෝ වක්‍ර ලෙස අප ආහාරයට ගන්නා එළවළු, පලතුරු වල අඩංගු විෂ රසායන හේතු විය හැක. මෙම තත්ත්වය අපගේ අපනයන කෘෂි නිෂ්පාදන වෙළඳපොල කෙරේ සෘණාත්මක බලපෑමක් ඇති කළ හැකි වීමත් එවැනි භාවිතයට නුසුදුසු එළවළු, පලතුරු තුළින් දරුවන් ඇතුළු සමස්ථ ප්‍රජාව කෙරෙහි ඉතා භයානක බලපෑම් ඇති කළ හැකි වීමත් නිසාවෙන් මේ සඳහා කඩිනම් පිළියම් සිදු කළ යුතුව ඇත.

එබැවින් මෙම අවදානම් තත්ත්වයෙන් පාරිභෝගිකයා, බෝග නිෂ්පාදන කාර්යයේ නියැලි ගොවි ජනතාව හා වෙළඳපොල ආරක්ෂා කිරීමට සුරක්ෂිත බෝග නිෂ්පාදන ක්‍රමයක් හඳුන්වා දීමත් ඒ සඳහා නිසි ප්‍රමිතිකරණයක් ලබා දීමත් මගින් නියාමනයක් පවත්වා ගැනීමේ අරමුණ ඇතිව කෘෂිකර්ම අමාත්‍යාංශයේ මඟ පෙන්වීමෙන් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් SL GAP සහතිකකරණ ක්‍රමවේදය හඳුන්වා දෙන ලදී.

## එළවළු, පලතුරු සඳහා ප්‍රමිතිකරණයක අවශ්‍යතාවය

නිරෝගී දිවිපෙවෙතක් වෙනුවෙන් සෞඛ්‍ය සම්පන්නව නිපදවූ ගුණාත්මයෙන් ඉහළ විශ්වාසනීය ආහාර තෝරා ගැනීම පිළිබඳව වත්මන් පාරිභෝගික ප්‍රජාව සතුව දැඩි උනන්දුවක් පවතී. එනිසාවෙන්ම ඔවුන් තම ආහාර ද්‍රව්‍ය මිලදී ගැනීමේ දී බුද්ධිමත්ව සැලකිල්ලෙන් කටයුතු කරනු ලබයි.








මේ අනුව, දූෂ්‍යවීම් වලින් තොරව නිපදවූ නැවුම් එළවළු හා පලතුරු සඳහා වන පාරිභෝගික උනන්දුව සීඝ්‍ර ඉහළ යාමක් පෙන්වයි. එසේම වත්මන් දියුණු සමාජය තම නිෂ්පාදන මිල දී ගැනීමේ දී ඒ තුළ ගුණාත්මක හා සෞඛ්‍යාරක්ෂිත මෙන්ම පාරිසරික තිරසර භාවය හා සමාජ සාධාරණීයත්වය යන ගුණාංග ආවරණය වන්නේදැයි විශේෂ අවධානයක් යොමු කරනු ලබයි.

උක්ත අවශ්‍යතා සපුරා ගැනීම වෙනුවෙන් පළිබෝධනාශක පනත, පාංශු සංරක්ෂණ පනත වැනි නීතිමය ආවරණයන් පැවතිය ද අනිසි භාවිතයන් නිසා පළිබෝධනාශක අවශිෂ්ඨ මඟින් සිදුවිය හැකි හානි හා අපිරිසිදු ජල ප්‍රභව භාවිතයෙන් හානිකර ක්ෂුද්‍ර ජීවීන්ගේ බලපෑම් වැනි පළිබෝධනාශක නොවන ක්‍රම ඔස්සේ නිෂ්පාදනය දූෂණය වීම් වෙනුවෙන් අපේක්ෂිත මට්ටමේ පිටිවහලක් නොවන බැවින් ඉන් ඔබ්බට වූ ක්‍රමවේදයක අවශ්‍යතාවයක් පැන නැඟී ඇත.

ඒ අනුව ඉහත පාරිභෝගික අවශ්‍යතාවය සපුරාලීමට හා ඒ බව තහවුරු කරලීම සඳහා පූර්ව සැකසූ ක්‍රමවේදයක් ඔස්සේ ප්‍රමිතිකරණයක් මඟින් නියාමනය කිරීම තුළින් තෙවන පාර්ශවීය ලෙස මේ සඳහා දායකවීමේ අවකාශයක් පවතී.







ගුණාත්මක නිෂ්පාදන කෙරෙහි ඉල්ලුම දක්වන පාරිභෝගික පිරිස තම මිලදී ගැනීම විශ්වාසනීය තෙවන පාර්ශවයක් විසින් සහතික කිරීමක් හෝ නියාමනයක් අපේක්ෂා කරනු ලබයි. ඒ අනුව මෙම තෙවන පාර්ශවීය සහතිකකරණයක් සහිත නිෂ්පාදන වලට වෙළඳපොලේ ඉහළ මිලක් පවතින අතර, එය කන්නය හෝ සුලබතාවය මත සැළකිය යුතු මිල වෙනස්වීමකින් තොරව අලෙවිය සිදුවේ.

දේශීය හෝ විදේශීය වෙළඳපොල තුළ පවතින මෙම සුවිශේෂී අවස්ථාව මඟින් දේශීය කෘෂි නිෂ්පාදකයා වෙත වාසි අත්කර ගැනීමට නිසි ප්‍රමිතිකරණයක් යටතේ විශ්වාසනීය නිෂ්පාදනයක් සිදු කිරීම අත්‍යාවශ්‍ය වේ.

## ප්‍රමිතිකරණයක් හඳුන්වාදීම

පාරිභෝගික සුරක්ෂිතතාවය තහවුරු කිරීමත් වෙළඳපල ප්‍රතිලාභ දේශීය එළවළු, පලතුරු ගොවීන් වෙත ලබාදීමත් අරමුණු කොට ගෙන එළවළු හා පලතුරු නිෂ්පාදනවල ඉහත කරුණු පිළිබඳව විශ්වාසනීයත්වය තහවුරු කිරීම සඳහා කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය සමඟ යහපත් කෘෂිකාර්මික පිළිවෙත් ප්‍රමිතිය හඳුන්වා දී ඇති අතර ඒ අනුව SLS 1523 Part 1 ප්‍රමිතිකරණය යටතේ ශ්‍රී ලංකා යහපත් කෘෂි පිළිවෙත් (Sri Lanka Good Agricultural Practices) යනුවෙන්






ප්‍රමිතිකරණයක් හඳුන්වා දී ඇත. මෙම ප්‍රමිතිකරණය යටතේ අදාල GAP පිරිවිතරයන්ට අනුකූලව නිෂ්පාදනය කරනු ලබන එළවළු, පලතුරු ගොවිපල සඳහා SLGAP සහතිකකරණය සිදු කරනු ලැබේ.

## SL-GAP නිෂ්පාදන යනු මොනවාද?

මෙහිදී SL-GAP ප්‍රමිතිය යටතේ නිපදවා ඇති බවට කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ SL-GAP සහතිකය හිමි වූ නිෂ්පාදනයන්වේ. මෙමඟින් මෙම නිෂ්පාදනයන්ගේ ගුණාත්මක හා සෞඛ්‍ය ආරක්ෂිත බව පිළිබඳ තහවුරුවක් පාරිභෝගිකයා වෙත ලබාදේ.

## SL-GAP නිෂ්පාදන පරිභෝජනය තුළින් අප හට අත්වන වාසි මොනවාද?

- විශ්වාසනීය අයුරින් ගුණාත්මකව හා සෞඛ්‍ය ආරක්ෂිතව නිපදවූ එළවළු පලතුරු වැනි කෘෂි නිෂ්පාදන භාවිතයෙන් කෘෂි නිෂ්පාදනයන්ගෙන් ඇතිවිය හැකි සෞඛ්‍යමය අවදානම අවමවීම.
- කෘෂි රසායන අවශේෂයන්ගෙන් තොර ආහාර භාවිතය තුළ නීරෝගිමත් අනාගත දරු පරපුරක් බිහිවීම.
- මනා කළමනාකරණය තුළ අනවශ්‍ය යෙදවුම් භාවිතය අඩු වීමෙන් නිෂ්පාදන පිරිවැය අවම කර ලාභය ඉහළ නංවාගත හැකිවීම.
- විධිමත් සම්පත් කළමනාකරණය තුළින් පාරිසරික හානි අවමවීම හා නිෂ්පාදකයාගේ, සේවකයන්ගේ සෞඛ්‍ය ආරක්ෂිතබව සුරක්ෂිතවීම.






- ගුණාත්මක නිෂ්පාදන සඳහා වන නව දේශීය හා විදේශීය වෙළඳපොල අවස්ථා තුළින් ආර්ථික වාසි අත්කර ගැනීමට හැකිවීම.
- නිෂ්පාදනවල ආරක්ෂිත බව තහවුරුවීම තුළින් අපනයනයන්හි දී නිෂ්පාදන ප්‍රතික්ෂේප වීම අවම වේ.
- අස්වනු අලෙවියේදී අවදානම හා අඩමානයකින් තොරව ස්ථාවර අදායම් මට්ටමක් පවත්වා ගැනීමට හැකිවීම.
- වගා හිමිකරුවන්ගේ මෙන්ම සේවකයන්ගේ සුබසාධනය හා සෞඛ්‍ය ආරක්ෂාව ඉහළ නැංවීම තුළින් ඔවුන්ගේ යහ පැවැත්ම තහවුරුවීම.
- මනා කළමනාකරණයක් යටතේ ක්‍රමවත් තිරසාර ගොවිපලක් පවත්වා ගැනීමට හැකිවීම.
- සමාජ පිළිගැනීමකින් යුතු පරිසර හිතකාමී නිෂ්පාදන සිදු කිරීමෙන් හා එවැනි නිෂ්පාදන පරිභෝජනය කිරීම තුළින් ආත්මාභිමානයක් ලබා ගත හැකිවීම.



## සහතිකකරණ ලද SL-GAP නිෂ්පාදන හඳුනාගන්නේ කෙසේද?

සෑම සහතිකකරණ ලද නිෂ්පාදන ඒකකයක්ම SL-GAP ප්‍රවර්ධන ඒකකයේ නිළධාරියකුගේ අධීක්ෂණය යටතේ ඇසුරුම් කිරීම සිදුකරන අතර සෑම ඇසුරුමක් සඳහාම SL-GAP ලාංඡනය හා අනුරේඛිත කේතනයක් (QR Code) සහිත ස්ටිකරයක් හෝ ලේබලයක් යොදනු ලැබේ. මේ සඳහා ඔබගේ ස්මාර්ට් ජංගම දුරකථනයේ QR Code reader යෙදවුම (Mobile Phone App) මඟින් අදාල තොරතුරු ක්ෂණයකින් ලබාගත හැක. තවද නිෂ්පාදනය පිළිබඳ සියලු තොරතුරු කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ SL-GAP නිෂ්පාදකයින්ගේ තොරතුරු ඇතුළත් http://www.slgap.lk/certificates.php වෙබ් අඩවියට පිවිසීමෙන් ද ලබාගත හැක.






## SL GAP නිෂ්පාදන ලබා ගත හැකි ස්ථාන

සහතිකකරණය ලැබූ ගොවිපල එළවළු හා පලතුරු පාරිභෝගිකයන් වෙතට පත් කිරීම අරමුණු කොට ගෙන, ලියාපදිංචි සුපිරි වෙළඳසැල් හා කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ අනුමැතියෙන් ස්ථාපිත විශේෂිත GAP නිෂ්පාදන අලෙවි සැල් ජාලයක් මඟින් SL - GAP සන්නාමය සහිතව විශ්වාසනීය ලෙස සැපයීම් කිරීමට කටයුතු කර ඇත.

## GAP ක්‍රමය යටතේ ගොවිපලක් පවත්වාගෙන යාමේ දී මූලික වශයෙන් ඔබ සිදු කළ යුතු කටයුතු

ප්‍රධාන වශයෙන් පහත සඳහන් කරුණු අනුගමනය හා අදාල තොරතුරු වාර්තා පවත්වා ගැනීම තුළින් ඔබට පහසුවෙන් GAP වගාකරුවකු වීමට හැකියාව පවතී.

1. **ගොවිපල සඳහා භූමිය :** නියමිත සීමා මායිම් සහිත යහපත් වටපිටාවක බෝග වගාවට නිර්දේශිත සුදුසු, නීත්‍යානුකූල අවසරයක් සහිත භූමියක් තෝරා ගැනීම.




2. **වගා පරිසරය :** භෞතික, රසායනික හෝ ජෛවීය ලෙස නිෂ්පාදන දූෂ්‍යවීම වැළැක්වීම සඳහා සුදුසු ක්‍රියාමාර්ග ගැනීම. මේ යටතේ ගොවිපල ක්ෂේත්‍රයේ පස හා ජලය දූෂිත තත්ත්වයේ නොවන බවට තහවුරු කිරීම. ගොවිපල භෝග අවශේෂ හා අප ජලය ක්‍රමවත් ලෙස බැහැර කිරීම. අපද්‍රව්‍ය මනා ලෙස කළමනාකරණය සිදුකළ යුතු වේ.




3. **ගොවිපල ව්‍යුහයන් පවත්වා ගැනීම :** පිළිගත් ක්‍රමවේදයන්ට අනුව පාංශු සංරක්ෂණය, කාර්යක්ෂම ජල කළමනාකරණය, ගොවිපල ගබඩා ඇතුළු ව්‍යුහ කළමනාකරණය හා අස්වනු හැසිරවීමේ ස්ථානයන් ඇතුළු සියළු ගොවිපල ව්‍යුහයන් නිසි පරිදි පවත්වා ගැනීම සිදුකළ යුතුවේ.





4. **ගොවිපල නඩත්තු කටයුතු :** කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ පිළිගත් ක්‍රමවේදයන්ට අනුව ගොවිපල පරිශ්‍රය හා ගොවිපල යන්ත්‍රෝපකරණ නියමිත පරිදි නඩත්තු කොට පවත්වා ගැනීම.






5. **බෝග පාලන කටයුතු :** නිර්දේශිත බීජ රෝපණ ද්‍රව්‍ය, වගා ක්‍රම හා යෙදවුම් භාවිතා කරමින් ඒකාබද්ධ පළිබෝධ හා පෝෂක කළමනාකරණය අනුගමනය කර අවශ්‍යතාවයේ දී පමණක් නිර්දේශිත පරිදි පළිබෝධ නාශක හා පොහොර භාවිතයත් පසු අස්වනු හානි අවම වන ලෙස ප්‍රශස්ථ අස්වැන්නක් ලබා ගැනීමටත් කටයුතු සිදුකළ යුතුවේ.



6. **ගොවිපල තොරතුරු වාර්තා පවත්වා ගැනීම :** ඉහත සඳහන් කටයුතු සනාථනය කිරීම, එම තොරතුරු අනුරේඛණය කිරීම හා එම දත්ත පදනම්ව සහතිකකරණ කටයුතු සිදු කිරීම සඳහා අදාල සියළු කටයුතු වෙනුවෙන් වාර්තා සටහන් තබා ගැනීම සිදු කළ යුතුය.



7. **සේවක ආරක්ෂාව හා සුභසාධනය පවත්වා ගැනීමට කටයුතු කිරීම :** නිෂ්පාදන ක්‍රියාවලිය හා සම්බන්ධ සියළුම පුද්ගලයින්ගේ සුභසාධනය හා සනීපාරක්ෂාව වෙනුවෙන් ප්‍රමාණවත් පහසුකම් සැපයීමත් සිදු කළ යුතුවේ.










## මේ සඳහා අපෙන් ඔබ වෙත සැලසෙන පහසුකම්

- ඉහත කටයුතු ඉටුකර ගැනීම සඳහා කෘෂි ව්‍යාපාර උපදේශක, කෘෂිකර්ම උපදේශක හා තාක්ෂණ සහයකවරයකුගේ සමීප සහයෝගය හා අධීක්ෂණය නොමිලේ ලබා දීම.
- සහතිකකරණයට අදාලව නොමිලේ රසායනාගාර පරීක්ෂාවන් සිදුකර දීම හා GAP ගොවිපල සංවර්ධන කාර්යයන් සඳහා විවිධ පහසුකම් සලසා දීම.



- ආරම්භයක් වශයෙන් නොමිලේ සිදුකරනු ලබන SL-GAP (QR කේතය සහිතව) සහතිකකරණයක් සිදු කර දීම හා නිෂ්පාදන වලට අදාල ලේබලයන් ලබාදීම.
- දේශීය හා විදේශීය වෙළෙඳපල වෙත පිවිසීම සඳහා අවශ්‍ය සම්බන්ධීකරණ කටයුතු සිදුකර දීම.









ඔබත් යහපත් කෘෂි පිළිවෙත් (GAP) යටතේ වගා කර SL - GAP සහතිකයක හිමිකරුවකු වීමට අදහස් කරන්නේ නම්

**අතිරේක අධ්‍යක්ෂ, බීජ සහතික කිරීමේ සේවය, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, ගන්නොරුව යන ලිපිනයෙන් හෝ 0812 388 217 යන දුරකථන අංකය අමතා වැඩිදුර තොරතුරු විමසන්න.**

**තාක්ෂණික දායකත්වය**

එච්.ආර්.යූ.ටී එරබඳුපිටිය

(සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ)

කේ.එම්.එන්. තෙන්නකෝන්

(කෘෂිකර්ම උපදේශක)

බීජ සහතික කිරීමේ සේවය

**කෘෂි ප්‍රකාශන කළමනාකරණය**

එස්.පෙරියසාමි

එම්.එෆ්.එම්. රිස්වාන්

ජාතික කෘෂිකර්ම තොරතුරු හා සන්නිවේදන මධ්‍යස්ථානය

**සහය ප්‍රකාශන කළමනාකරණය**

ශ්‍රියන්තා මැණිකේ

ලක්මිණී නාරංගම්මන

**පිටු සහ පිටකවරය නිර්මාණය**

එල්.පී. කුමුදු සෙනවිරත්න

SLGAP

DEPARTMENT OF AGRICULTURE - SRI LANKA

NAICC
*Designed by :*
**NATIONAL AGRICULTURE INFORMATION & COMMUNICATION CENTRE,**
Department of Agriculture